CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# දිවි නැගුම පනත් කෙටුම්පත පිළිබඳ සටහන

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2013 ජනවාරි

දිවිනැගුම පනත් කෙටුම්පත (මෙහි පහත පනත් කෙටුම්පත යැයි සඳහන්) 2013 ජනවාරි මස තුළදී පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමකට ලක් කිරීමට නියමිත බවට, 2012 දෙසැම්බර් මස නිකුත් කරන ලද මාධ්‍ය වාර්ථා මගින් දක්වන ලදි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (වි.ප්‍ර.කේ) මෙම සටහන සකස් කරනු ලැබුයේ මෙකී පනත් කෙටුම්පත එහි වර්ථමාන ස්වරූපයෙන් සම්මත ව ක්‍රියාත්මක වන්නේ නම්, ඒ හා සබැඳි මූලික ගැටලු හා එහි ඵලවිපාක පිළිබඳ කරුණු දැක්වීමේ අරමුණිනි. පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂඨාධිකරණයේ පෙත්සමක් ගොනු කිරීම හා දැනුවත් කිරීමේ ලිපිලේඛන භාෂාත්‍රයෙන් සකස් කරමින් යන දෙයාකාරයෙන්ම වි.ප්‍ර.කේ. මෙම ගැටලු පිළිබඳ 2012 දී ද කරුණු දැක්වීම සිදු කරන ලදි.

## දිවිනැගුම පනත් කෙටුම්පතට අදාළ පසුබිම

රජය විසින් 2012 අගෝස්තු මස 10 දින දිවි නැගුම පනත් කෙටුම්පත (මෙහි පහත පනත් කෙටුම්පත යයි සඳහන්) පාර්ලිමේන්තුවෙහි සභාගත කරන ලදී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂවරයා විසින් මෙම පනත් කෙටුම්පතෙහි අඩංගු විධිවිධාන ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක්කරන ලදී (එස් සී / එස් ඩී 3 / 2012). ශ්‍රේෂ්ඨාධිකරණය වෙත තවත් පෙත්සම් 2ක් ද ගොනු කරන ලදී.[1] අගෝස්තු මස 27 සහ 28 යන දිනවලදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත කී පෙත්සම් විභාග කරන ලද අතර එකී කාරණය සම්බන්ධයෙන් ඊට අදාළ තීරණය 2012 සැප්තැම්බර් මස 18වන දින දී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුව අනුව පෙත්සම තුළ ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් එකඟතාවය දක්වන අතර මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් සභා ලැයිස්තුවට අදාළ විෂයන් සම්බන්ධයෙන් වන බවට තීරණය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (උ) 3 වගන්තියට අනුව එවැනි ආකාරයේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ

[1] එස් සී / එස් ඩී / 2012 සහ එස් සි / එස් ඩී 02/2012

න්‍යාය පත්‍රයේ ඇතුළත් කිරීමට පෙර මධ්‍යම රජය විසින් පළාත් සභාවන්හි අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වන බව ප්‍රකාශ කරන ලදි.[2]

ඉන් අනතුරුව පනත් කෙටුම්පත 2012 සැප්. 21[3]පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ගන්නා ලද අතර පළාත් සභාවන්හී අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. මෙකී පනත් කෙටුම්පත වෙනුවෙන් තම කැමැත්ත ලබාදීම සඳහා පළාත් සභා අට ම ඡන්දය භාවිතාකරන ලද අතර[4] ඒ හා සමඟ උතුරු පළාත් සභාව වෙනුවෙන් ඊට අදාළ අනුමැතිය, උතුරේ ආණ්ඩුකාරවරයා, විසින් ලබා දී ඇති බවද වාර්ථා විය. ඉන් අනතුරුව නැවත වරක් මෙකී පනත් කෙටුම්පත 2012 ඔක්. මස 09[5] වන දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ ඇතුළත් කරන ලදි. දෙවන වරටත් පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයේ මෙකී පනත් කෙටුම්පත ඇතුළත් කළ ද නැවතත් වි.ප්‍ර.කේ හා එහි විධායක අධ්‍යක්ෂවරයා ද ඇතුළත් ව පෙත්සම්කරුවන් කිහිපදෙනෙක් මෙම පනත් කෙටුම්පත නැවතත් අභියෝගයට ලක් කරන ලදි. මෙලෙස අභියෝගයට ලක් කිරීමෙහිලා පදනම වූයේ වෙනත් අදාළ කාරණා කිහිපයක් ද ඇතුළත් ව ප්‍රධාන වශයෙන් ආ.ක්‍ර.ව්‍ය. 154 (උ) 3, ව්‍යවස්ථාප්‍රකාර පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයේ මෙකී පනත් කෙටුම්පත නියමිත පරිදි අන්තර්ගත නොකිරීමේ හේතුව ද මුල් කර ගනිමිනි.

ශ්‍රේෂ්ඨාධිකරණය 2012 ඔක් මස මෙකී පනතට අදාළ ව තම තීරණය ලබා දෙමින් සඳහන් කරන ලද්දේ පනත් කෙටුම්පතේ වගන්ති කිහිපයක් ව්‍යාවස්ථාවට පටගැනි බවත් ඒ අනුව පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සම්මත කළ යුතු බවත්ය.[6] තව දුරටත් එහි දී ප්‍රකාශවූයේ පනත් කෙටුම්පතේ 8 (2) සහ 35 (1), (ආ), (ඉ) සහ (ඊ) යන වගන්ති ආ.ක්‍ර.ව්‍ය. 3 ව්‍යවස්ථාවට පටගැනි බවත් ඒ අනුව පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් **සහ** ජනමත විචාරණයක් හරහා ජනතා කැමැත්තෙන්ද සම්මත කළ යුතු බවයි. ශ්‍රේෂ්ඨාධිකරණය තව දුරටත් යෝජනා කරන ලද්දේ 8 (2) සහ 35(1), (ආ), (ඇ) සහ (ඈ) සහ වගන්ති සංශෝධනය කිරීම 3 ව්‍යවස්ථාවට

---

[2] පෙත්සමට අදාල වැඩිදුර ලේඛන අවශ්‍ය වන්නේ නම් කරුණාකර වි.ප්‍ර.කේ. අමතන්න

[3] 2012 සැප්.21 Ada Derana.lk, "න්‍යාය පත්‍රයෙන් දිවිනැගුම පනත් කෙටුම්පත ඉවත් කරනු ලැබේ", http://www.adaderana.lk/news.php?nid=19750

[4] http://med.gov.lk/english/?p=13642; "පළාත් සභා යෝජිත දිවිනැගුම පනත් කෙටුම්පත පිළිගනියි" 2012 ඔක් 04, News line
http://www.priu.gov.lk/news update/Current Affairs/ca201210/20121004provincial councils endorse proposed divi neguma bill.htm

http://sundaytimes.lk/news/sri-lanka/4015-divi-neguma-bill-in-parliment-on-january-8

[5] ටයිම්ස් ඔන්ලයින්, http://sundaytimes.lk/index.php?option=com content&view=article&id=25305:divineguma-bill-re-introduced&catid=1:latest-news&ltemid=547, 2012 ඔක් 09

[6] වගන්ති 5(ඈ), වගන්ති 7, වගන්ති 11, වගන්ති 14, වගන්ති 17 එම්,වගන්ති 18, වගන්ති 19, වගන්ති 25 (4), වගන්ති 29 (4), වගන්ති 42

අදාළ ව පවතින නොගැලපීම සඳහා විසඳුමක් වන බවයි. ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා උපුටා දැක්වූ මාධ්‍ය වාර්ථා කරන ලද්දේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ලබාදෙන ලද උපදෙස් අනුව 8 සහ 35[7] යන වගන්ති සංශොධනය කර ඇති බවයි. තවත් මාධ්‍ය වාර්ථා මඟින් දක්වන ලද්දේ 2013 ජනවාරි මස 08 හෝ 09 යන දිනවල මෙම පනත් කෙටුම්පතට අදාළ විවාදය පාර්ලිමේන්තුවේදී පැවැත්වීමට නියමිත බවයි.[8] මෙම සටහන පිළියෙල කරන අවස්ථාව වන විට සංශෝධිත පනත් කෙටුම්පත ලබාගැනීමේ අවස්ථාවක් නොමැති අතර ඒ අනුව වි.ප්‍ර.කේ.ට යෝජිත සංශෝධන පිළිබඳ අදහස් දැක්වීමේ හැකියාවක් නැත.

2012 දී ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කිරීමට අමතරව, මෙම කරුණ සම්බන්ධව වි.ප්‍ර.කේ විසින් දිවයින පුරා දැනුම්වත්කිරීමේ රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලදි. පනත් කෙටුම්පතෙහි ඇතුළත් වගන්ති පිළිබඳ මහජන දැනුවත්භාවයේ සීමා සහිතකම, හා නිළධාරීන් මෙන් ම මහජන නියෝජිතයන් ද ඇතුළත්ව පොදුවේ ජනතාව, මෙකී පනත් කෙටුම්පත ක්‍රියාවට නැඟෙන්නේනම් එමඟින් අදහස් වන්නේ කුමක්ද යන්න පිළිබඳ පවත්නා අවම දැනුවත්භාවය, මෙලෙස දැනුම්වත්කිරීමක් ඇරඹීමට හේතුවිය. වි.ප්‍ර.කේ මීට පෙර ද දැක්වූ පරිදි හා නැවනත් අවධාරණය කරන පරිදි මූලිකවම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක්කරනු ලැබුවේ, එහි අඩංගු දරිද්‍රතාවය තුරන්කිරීම හෝ එසේත් නැත්නම් සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය හෝ උඩරට සංවර්ධන අධිකාරියෙහි සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස විශ්‍රාම දීමනා හෝ වෙනත් අදාල ප්‍රතිලාභ ලබාගැනීමෙන් වලක්වාලීම සඳහා නොවේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හඳුනාගන්නා පරිදි, මෙරටේ ව්‍යවස්ථානුකූල හා නිතිමය රාමුවට යටත් ව මෙවැනි ක්‍රියාමාර්ග සිදුකරනු ලබන්නේනම්, මෙවන් අවස්ථා නිසැකව ම නියමිත අවධානය සහ සහය ලැබිය යුතු ඉතා වැදගත් කාරණාය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක්කරනු ලැබුවේ අත්තනෝමතික ලෙස පළාත්සභා වල බලය උදුරාගැනීම සහ ඉතා අවම සංවරණ හා තුලනයක් සහිතව එක් අමාත්‍යවරයෙකු කේන්ද්‍රකරගනිමින් බලය සංකේන්ද්‍රනය කිරීමට එමගින් උත්සාහ දරා ඇති නිසාය.

පනත් කෙටුම්පතෙහි ප්‍රධාන විධිවිධාන හා එය පනවන ලද්දේ නම් ඇතිවන බලපෑම පිළිබඳව මූලික මඟ පෙන්වීමක් ලබා දීම සඳහා මෙම සටහන 2012 දී පිළියෙ කරන ලදි. මෑතකාලීන සිදුවීම් ද පාදක කර ගනිමින් පිළියෙල කරන ලද මෙම සටහන එලෙස සකස් කරනලද සටහනට ම අලුතෙන් කරුණු එකතු කිරීමක් වේ. මෙකී පනත් කෙටුම්පතෙහි වගන්ති විවිධ ක්ෂේත්‍ර කෙරෙහි බලපෑමක් ඇති කළ ද මෙම සටහනෙහි දී මූලිකව ම අවධානය යොමු කරන ලද්දේ බලය බෙදා

---


[7] "ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව දිවිනැගුම පනත් කෙටුම්පත සංශෝධනය කරයි", ෂාමි නුවන් ගනේවත්ත, දිවයින 2012 දෙසැ 18

[8] "දිවිනැගුම පනත් කෙටුම්පත, ජනවාරි 08 පාර්ලිමේන්තුවට", News.lk 2012 දෙසැ. 31,
"දෝශාභියෝග යෝජනා විවාදය ලබනමාසයේ" , අජන්ත කුමාර අගලකඩ, ඩේලිමිරර්, 2012 දෙසැ 28

හැරීම කෙරෙහි මින් සිදු වන බලපෑම කෙරෙහිය. පනත් කෙටුම්පතෙහි විෂයපථය හා එය බලය බෙදාහැරීම, රාජ්‍යකරණය හා තනිපුද්ගල අයිතීන් කෙරෙහි සිදු කළ හැකි බලපෑම පිළිබඳව මහජනතාව හා වෙනත් අදාළ පාර්ශව දැනුම්වත්වීම සඳහා මෙම සටහන හා වෙනත් මීට අදාළව සිදු කරනු ලබන මෙවන් දැනුම්වත් කිරීම්, උපයෝගී වේයැයි යන්න වි.ප්‍ර.කේ අපේක්ෂාවයි.

## 1. පනත් කෙටුම්පත මගින් ස්ථාපිත කිරීමට අපේක්ෂිත ආයතනික ව්‍යුහයන්

පහත සඳහන් සටහනෙහි විස්තර කර ඇති ආකාරයට ආයතන කිහිපයක් ස්ථාපිත කිරීමට මෙම පනත් කෙටුම්පත මගින් අපේක්ෂාකරනු ලැබේ. ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර වන්නේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව (4, 5 සහ 6 වන වගන්ති) දිවිනැගුම දිස්ත්‍රික්ක කමිටු (20, 21 සහ 22 වැනි වගන්ති) දිවිනැගුම කලාපීය සංවිධාන (16, 17 සහ 18 වගන්ති) සහ දිවිනැගුම ප්‍රජා පාදක සංවිධාන (10, 11 සහ 12 යන වගන්ති) යන පුළුල් විෂය ක්ෂේත්‍රයක් තුළ විෂය ගණනාවක් ආවරණය කරන ආයතන වල අරමුණු බලතල සහ කාර්යයන්ය.


අමාත්‍යවරයා
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව (4, 5 සහ 6 වගන්ති)
දිවිනැගුම ජාතික සභාව (7 සහ 42 වගන්ති)
දිවිනැගුම ජාතික සම්මේලනය (23 සහ 24 වගන්ති)
දිවිනැගුම දිස්ත්‍රික් කමිටු (20, 21 සහ 22 වගන්තී)
දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන(16, 17 සහ 18 වගන්ති)
දිවිනැගුම ප්‍රජා පාදක සංවිධාන (10, 11 සහ 12 වගන්ති)
ප්‍රජා පාදක බැංකුවල සහ බැංකු සංගම්වල කළමනාකරණ මණ්ඩලය (33 වගන්තිය)
ප්‍රජා පාදක බැංකු සංගම් (30, 31 සහ 32 වගන්ති)
ප්‍රජා ප්‍රාදක බැංකු (26, 27 සහ 28 වගන්ති)

## 2. බලය බෙදීමට අදාල බලපෑම

පෙත්සම්කරුවන් විසින් පෙන්වා දෙන ලද පරිදි සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් ආකාරයට පළාත් සභා ලැයිස්තුවට අයත් විෂයයන් ගණනාවක් පනත් කෙටුම්පත තුළ අන්තර්ගත වේ. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා වලට පවරා දෙන ලද විෂයයන් ගණනාවක් පවරා ගැනීමට මෙමගින් මධ්‍යම ආණ්ඩුවට හැකියාව ලැබෙනු ඇත.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභාවලට පවරා දෙන ලද විෂයයන් කෙරෙහි බලපෑම් කරන මෙම පනත් කෙටුම්පතෙහි අන්තර්ගත විවිධ වගන්ති පහත සඳහන් වගුව තුළ දක්වා ඇත.[9]

| පනත් කෙටුම්පතෙහි වගන්තිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ අදාළ විෂයය (පළාත් සභා ලැයිස්තුව) |
|---|---|
| 4 (අ) වගන්තිය - දිළිඳු බව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම (දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) | විෂය අංක 2 - සැලසුම් - පළාත්වලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම<br>විෂය අංක 10 - ග්‍රාම සංවර්ධනය |
| 4 (ඇ) වගන්තිය - එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම | විෂය අංක 16 - පළාත ඇතුළත ආහාර සැපයීම සහ බෙදා හැරීම |
| 4 (ඊ) - ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) | විෂය අංක 5.3 - පළාත් සභා ලැයිස්තුවේ සඳහන් විෂයයන් හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු<br>විෂය අංක 6 - පළාත ඇතුළත පාරවල් පාලම් සහ වෙළඳපොලවල් |
| 4(ඒ) - සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් | විෂය අංක 7.2 - අනාථ තැනැත්තන් සහ |

[9] මෙම කොටස එස් සී එස් ඩී 03 / 2012 දරණ නඩුවට ගොනු කරන ලද ලිඛිත දේශන මත සහ 2012 සැප්. 18 පාර්ලිමේන්තුවේදී නැවත සාකච්ඡා කරන ලදශ්‍රේෂ්ඨාධිකරන තීරණය මත පදනම් ව ඇත

| | |
|---|---|
| සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම (දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) | පවුල් පුනරුත්ථාපනය<br><br>විෂය අංක 7.3 - කායික, මානසික සහ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය<br><br>විෂය අංක 7.4 - විශේෂ හැකියාවන් සහිත සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම |
| 5 (ඇ) දිවි නැගුම ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ගබඩා කිරීම, අලෙවිකරණය සහ සැකසීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම සහ එහි කාර්යය සඳහා භෞතික සහ මූල්‍ය සම්පත් ලබා දීම (දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) | විෂය අංක 15 - වෙළඳපොළවල්, පොළවල් |
| 5 (ඔ) ජනතාවගේ ජීවන තත්ත්වය ආර්ථික වශයෙන් සහ සාමාජීය වශයෙන් ඉහළ නංවනු ලබන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ යටිතල පහසුකම් සවර්ධනය කිරීම (දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) | විෂය අංක 2 - සැලසුම් - පළාත්වලට අදාල ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම<br><br>විෂය අංක 5.3 - පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති විෂයයන් හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු<br><br>විෂය අංක 6 - පළාත ඇතුළත ඇති පාරවල් පාලම් සහ තොටුපලවල්<br><br>විෂය අංක 10 - ග්‍රාම සංවර්ධනය |
| 9 වන වගන්තිය - ප්‍රජා මූල සංවිධාන | විෂය අංක 17.1 - සමූපකාර ව්‍යාපාර සහ පළාත ඇතුළත සමූපකාර සමිති සංවිධානය, ලියාපදිංචිය, අධීක්ෂණය සහ විගණනය<br><br>විෂය අංක 17.2 - පළාත ඇතුලත සමූපකාර සංවර්ධනය<br><br>විෂය අංක 28 - සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ, සාහිත්‍ය, විද්‍යා, ආගමික සහ වෙනත් සමිති හා සංගම් විධිමත් කිරීම |

| | |
|---|---|
| 11 (ඔ) ප්‍රජා ශ්‍රම දායකත්වයෙන් යුතුව දියත් කරනු ලබන සංවර්ධන වැඩසටහන් බාරගෙන ක්‍රියාත්මක කිරීම (ප්‍රජා මූල සංවිධාන) | විෂය අංක 2 - සැලසුම් - පළාත්වලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම<br><br>විෂය අංක 10 - ග්‍රාම සංවර්ධනය |
| 15 (1) වගන්තිය - දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන | විෂය අංක 17.1 - සමූපකාර ව්‍යාපාර සහ පළාත ඇතුළත සමූපකාර සමිති සංවිධානය, ලියාපදිංචිය, අධීක්ෂණය සහ විගණනය<br><br>විෂය අංක 17.2 - පළාත ඇතුළත සමූපකාර සංවර්ධනය<br><br>විෂය අංක 28 - සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ, සාහිත්‍ය, විද්‍යා, ආගමික සහ වෙනත් සමිති හා සංගම් විධිමත් කිරීම |
| 17 (ඉ) ප්‍රදේශය තුළ ස්වකීය ප්‍රතිලාභීන්ගේ කෘෂිකාර්මික හෝ වෙනත් යම් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් තාක්ෂණික සහාය සහ වෙනත් සේවාවන් සැපයීම | විෂය අංක 9 - පළාත්බද කාර්ය සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය සහ අධ්‍යාපනයද, කෘෂිකාර්මික සේවා ද ඇතුළුව කෘෂිකර්මය |
| 17 (ඊ) නිෂ්පාදන සහ අමුද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩා කිරීම, අලෙවි කිරීම සඳහා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සහ අලෙවි මධ්‍යස්ථාන සහ සාප්පු සංකීර්ණ සංවිධානය කිරීම (දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන) | විෂය අංක 15 - වෙළඳපොලවල් සහ පොලවල් |
| 18 (ඉ ) ප්‍රාදේශීය මට්ටමින් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා අමුද්‍රව්‍ය, තාක්ෂණය සහ වෙනත් ආශ්‍රිත සේවාවන් සැපයීම සහ එම නිෂ්පාදන අලෙවිකිරීම සඳහා පහසුකම් සැලසීම (දිවි නැගුම ප්‍රාදේශීය සංවිධාන) | විෂය අංක 10 - ග්‍රාම සංවර්ධනය<br><br>විෂය අංක 15 - වෙළඳපොලවල් සහ පොළවල්<br><br>විෂය අංක 21 - සංවර්ධන සහ ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය පිළියෙල කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ කෘෂිකාර්මික, කාර්මික, වාණිජ සහ වෙළඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති, එවැනි ව්‍යාපෘති සහ ව්‍යවසාය කරගෙන යාමට ආණ්ඩුවට සහ රාජ්‍ය |

| | |
|---|---|
| | සංස්ථාවලට ඇති බලයට හානියක් නොමැතිව පළාත ඇතුළත ප්‍රවර්ධනය කිරීමට පිහිටුවීමට යන ඒවායේ නිරතවීමට ඇති බලය |
| 18 (ඊ) දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන මගින් ක්‍රියාත්මක කරන්නා වූ සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා සහාය ලබාදීම (දිවිනැගුම ප්‍රාදේශීය සංවිධාන) | විෂය අංක 7.3 - කායික මානසික සහ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය<br><br>විෂය අංක 7.4 - විශේෂ හැකියාවන් සහිත සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන් හට සහන සලසාදීම |
| 26 (ඈ) දිවි නැගුම ප්‍රතිලාභීන්ට ණය පහසුකම් සැපයීම (දිවි නැගුම ප්‍රජා මූල බැංකු) | විෂය අංක 35 - පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට මුදල් ණයට ගැනීම |
| 31 (ආ) එහි අරමුදල් ආයෝජනය කිරීම, ණය පහසුකම් ප්‍රදානය කිරීම සහ ලාභ ගෙවීම | විෂය අංක 35 - පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට මුදල් ණයට ගැනීම |

පනත් කෙටුම්පතෙහි අරමුණු සහ පනත් කෙටුම්පත යටතේ පිහිටුවනු ලබන විවිධ ආයතනවල අරමුණු, බලතල සහ කාර්යයන් නිර්වචනය කර ඇති පුළුල් ආකාරය මෙන්ම පළාත් සභා සඳහා වෙන් කර ඇති විෂයය කෙරෙහි පනත් කෙටුම්පතෙහි විවිධ වගන්ති මගින් ඇති කරනු ලබන බලපෑම සැලකිල්ලට ගැනීමේදී පළාත් සභා මගින් ඉටු කරනු ලබන කාර්යයන් පළාත් සභාවන් මග හැර යමින් මධ්‍යම රජයට ඉටු කිරීමට අවසර ලබා දී, ජනතාවට සේවය කිරීමට පළාත් සභාවලට ඇති හැකියාව අඩු කරනු ලබන ආයතන පද්ධතියක් පනත මගින් නිර්මාණය කිරීමේ අවදානමක් පෙන්නුම් කෙරේ.

මෙමගින් පළාත් සභාවල කාර්යභාරය අඩු කොට අනාගතයේදී ඒවා කිසිදු ප්‍රයෝජනයක් නැති ආයතන බවට පත් කරනු ලැබිය හැකිය.

## 3. අමාත්‍යවරයා වෙත ලබා දී ඇති බලතල

පනත් කෙටුම්පත මගින් අමාත්‍යවරයා වෙත සුවිශේෂී බලතල ලබා දී ඇති අතර ඒවා පහත සැකෙවින් විස්තර කෙරේ.

(1) දිවි නැගුම ජාතික සභාවට (දි.ජා.ස) පත් කරනු ලබන සාමාජිකයන් 11 දෙනාගෙන් 6 දෙනෙකු පත් කිරීම සඳහා අමාත්‍යවරයාට බලතල ඇත (7 (2) වගන්තිය). දිවි නැගුම දෙපාර්තමේන්තුවේ පාලනය සහ ප්‍රතිපත්තිවලට අදාල කරුණු සම්බන්ධයෙන් අධිකාරී බලය දි.ජා.ස. වෙත පැවරෙනු ඇත (7 (1) සහ 42(1) වගන්ති). දිවිනැගුම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් දි.ජා.ස. විසින් පනවන ලද නීති ක්‍රියාත්මක කළ හැක්කේ අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබා දීමෙන් පසුව පමණි. (42 (2) වගන්තිය).[10]

(2) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවලට අයත් අරමුදල් දිවි නැගුම ප්‍රජා මූල බැංකුවල තැන්පත් කර පවත්වාගෙන යාම හා සම්බන්ධ නියෝග සම්පාදනය කිරීම (13 වගන්තිය).

(3) දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිවල ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය සහ එම ක්‍රියාපටිපාටීන්ට අදාල වෙනත් ඕනෑම කරුණක් නියම කිරීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේය (25(2) සහ 29(2) වගන්ති).

(4) දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ බැංකු සමිති සඳහා කළමනාකරණ මණ්ඩලයක් පත් කිරීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේය. කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් 8 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 5 දෙනෙකු නිල බලයෙන් පත් වන අතර ඉතිරි 3 දෙනා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේය. නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන් කිහිප දෙනෙකු අමාත්‍යවරයාට සමීපව සම්බන්ධ අය වේ.[11] දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ බැංකු සමිතිවල මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීමේ සහ නියාමනය කිරීම භාරව සිටින්නේ කළමනාකරණ මණ්ඩලයයි. කළමනාකරණ මණ්ඩලය ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් නියෝගයන්ට යටත් විය යුතු ය.

---

[10] එස් සී එස් ඩී 01/2012 දරන නඩුවට ගොනු කරන ලද ලිඛිත දේශනයේ මෙසේ සඳහන් වේ. "මෙම විධිවිධානය මගින් රාජ්‍ය සේවයේ නීතිරීති වලට පරිබාහිරව යමින් දිවි නැගුම ජාතික සභාව නම් විශේෂ ආයතනයක් මගින් පාලනය කරනු ලබන දෙපාර්තමේන්තුවක් නිර්මාණය කරනු ලැබේ. සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තු පාලනය කරනු ලබන්නේ අමාත්‍ය මණ්ඩල තීරණ, අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ, රාජ්‍ය සේවා කොමිසම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යනාදිය මගිනි. මෙම දෙපාර්තමේන්තුව විසින් රජයේ මූල්‍ය නියෝග අනුගමනය නොකිරීම වලක්වාලීම සඳහා කිසිදු විධිවිධානයක් සලසා නැත".

[11] නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන්නේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයෙක්, දෙපාර්තමේන්තුවේ බැංකු කටයුතු භාර අධ්‍යක්ෂවරයා, මහ බැංකුවේ අධිපතිවරයා විසින් පත් කරනු ලැබූ නියෝජිතයෙකු සහ අමාත්‍යාංශයේ ලේකම්වරයායි.

5. “දිවි නැගුම සංවර්ධන අරමුදල“ උපයෝජනය කරනු ලබන ආකාරය සහ අරමුණු නියම කිරීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේය. (35 වගන්තිය).

6. මෙම පනත් කෙටුම්පතෙහි කාර්යයන් සඳහා නියෝග සෑදීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේය. (41 වගන්තිය) මෙම සාමාන්‍ය බලයට අගතිය ඇති කිරීමකින් තොරව පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධ නියෝග සෑදීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේය.

(අ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධාන සහ දිවිනැගුම ප්‍රාදේශීය සංවිධානවල ව්‍යවස්ථාව සහ ඒ හා සම්බන්ධ කරුණු (41 (1) අ සහ (ආ) වගන්තිය)

(ආ) දිවිනැගුම ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්ණායක (41 (1) (ඉ) වගන්තිය)

(ඇ) දිවි නැගුම ප්‍රජා මූල සංවිධානවල සහ ප්‍රජා මූල බැංකුවල සාමාජිකයෙකු වීම සඳහා අදාල නිර්ණායක (41 (1) (ඊ වගන්තිය).

(ඈ) ප්‍රජා මූල සංවිධාන, ප්‍රජා මූල බැංකු සහ ප්‍රජා මූල බැංකු සමිති අධීක්ෂණය, නියාමනය සහ ඇගයීම හා සම්බන්ධ නිර්ණායක (41 (1) උ වගන්තිය).

(ඉ) දිවි නැගුම සංවර්ධන අරමුදල හා දිවි නැගුම චක්‍රීය අරමුදලට අදාළ සියලුම කටයුතු (41 (1) එ).

අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග ඒවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට ම ක්‍රියාත්මක වන අතර මාස 3 ක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතුය.

පනත මගින් සංවිධානය කරනු ලබන ආයතනවලට පුළුල් බලතල ඇති අතර නියෝග සෑදීමට සහ ප්‍රධාන තනතුරු වලට පුද්ගලයන්ව පත් කිරීමට අමාත්‍යවරයාට බලතල ඇති හෙයින් ඔවුන් අමාත්‍යවරයාට අවනතව කටයුතු කරනු ඇත. බලතල විමධ්‍යගත වන ආකාරයක් ව්‍යුහාත්මකව ප්‍රදර්ශනය වුව ද මෙම ආයතන සම්බන්ධයෙන් අති විශාල පාලනයක් අමාත්‍යවරයාට ඇති වීම ගැටළු සහගතය. ඊට හේතුව වන්නේ එමගින් එක් පුද්ගලයෙකු වෙත බලය තහවුරු වීමක් සිදු වන හෙයිනි.

**4. සාමාන්‍ය විධිවිධාන**

1. දිවි නැගුම දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සහ සේවකයින් ස්වකීය කාර්ය ඉටු කිරීමට පෙරාතුව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ වූ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය තමා විසින් සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතුය (38 වගන්තිය). අධිකරණය මගින් හෝ ලිඛිත නීතියක් මගින් නියමකරනු ලබන අවස්ථාවකදී හැර එකී තොරතුරු ඔවුන් විසින් අනාවරණය නොකළ යුතුය.

2. පනත් කෙටුම්පත යටතේ දෙපාර්තමේන්තුවේ බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුවට හැකිවීම සඳහා තමන් ඉල්ලා සිටින තොරතුරු ලබා දෙන ලෙස කිසියම් පුද්ගලයෙකුට නියෝග කරමින් ලිඛිතව දැනුම්දීමට දිවි නැගුම දෙපාර්තමේන්තුවට හෝ එහි බලයලත් නිලධාරියෙකුට බලතල ඇත්තේය (39 වගන්තිය). මෙම විධිවිධානය කෙටුම්පත් කිරීමට යොදා ගෙන ඇති භාෂාවේ පුළුල් ස්වභාවය අනුව කිසියම් තොරතුරක් ලබා දෙන ලෙස ඕනෑම පුද්ගලයෙකුට බල කිරීමේ කිරීමේ හැකියාව මෙමගින් දිවි නැගුම දෙපාර්තමේන්තුවට ලැබෙන්නේ යැයි අර්ථ නිරූපනය කිරීමට හැකියාවක් ඇත.

3. දිවි නැගුම පනතේ විධිවිධාන උල්ලංඝනය කරනා ඕනෑම පුද්ගලයෙකු (එය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ පසු) සිරදඬුවමකට හෝ දඩයකට යටත් විය යුතුය. (ලඝු නඩු විභාගයකින් පසු) (40 වගන්තිය). 39 වන වගන්තියේ පුළුල් සහ අපැහැදිලි ස්වභාවය මත මෙම විධිවිධානය විශේෂ වශයෙන්ම ගැටළු සහිතය.

## 5. දැනට පවතින අධිකාරින්හි සේවය කරනා සේවකයන්ගේ රැකියා ආරක්ෂා කිරීම [12]

1. 43 (ඉ) (1) වගන්තිය මගින් සේවකයන්ට දෙපාර්තමේන්තුවට සම්බන්ධවීමේ විකල්ප ලබා දෙන අතර එමගින් ඔවුන් රාජ්‍ය සේවකයන් බවට පත් වේ. කෙසේ වුවද ඔවුන්ගේ වැටුප් තත්ත්වයන් ආරක්ෂා කිරීම සඳහා පනත් කෙටුම්පත තුළ විධිවිධාන නැත. තවද දැනට සිටිනා සේවකයින් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ගන්නේද සහ එසේ කරන්නේ කවර ආකාරයකටද යන්න පිළිබඳවද තොරතුරු නැත.

2. 43 (ඉ) (11) වගන්තිය ප්‍රකාරව, සේවකයින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමට අදහස් කරන්නේ නම් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිතෝෂිකයක් ඔවුන් හට ගෙවනු ලබන අතර එම පාරිශ්‍රමිකය කිසිදු මාර්ගෝපදේශයකින් තොරව ඔහු විසින් අත්තනෝමතිකව තීරණය කරනු ලබනවා ඇත.

## 6 පනතට අදාළ විවාදය සඳහා අදාල කර ගත හැකි මූලික කරුණු

වි.ප්‍ර.කෝ. වසර 2012, ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද පනත් කෙටුම්පතේ සඳහන් විශේෂ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පිළිබඳ ඉහත කොටසේ දී කරුණු දක්වා ඇත. 2013 ජනවාරි මස තුළ ඉතා නුදුරු දිනෙක මෙම පනත් කෙටුම්පතට අදාළව පැවැත්වෙන විවාදය සඳහා උපයෝගී කර ගත හැකි පරිදි දේශපාලන පක්ෂ, මහජන නියෝජිතයන්, ප්‍රතිපත්ති

[12] මෙම කොටස එස් සී එස් ඩී 01 / 2012 දරණ නඩුවට ගොනු කරන ලද ලිඛිත දේශන මත පදනම්ව ඇත.

සම්පාදකයන් සහ වෙනත් අදාළ පිරිස් සඳහා මෙම පනත් කෙටුම්පතට අදාළ ව අවධානය යොමු කළ යුතු ප්‍රධානම කරුණු වි.ප්‍ර.කේ. මෙහිලා ලැයිස්තු ගත කර ඇත. මෙහිදී මතු කරනු ලබන කරුණු හුදු පනත් කෙටුම්පතට පමණක් සීමාවූ ඒවා නොව ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය හා බලය බෙදාහැරීමට අදාළව පුළුල් ලෙස සලකා බලන ලද කරුණු දැක්වීමක් ලෙස සැලකීම ඉතා වැදගත්ය.

1. තනි පුද්ගල/ ආයතනික/රජයේ යම් ස්ථර අතර බලය සංකේන්ද්‍රනය කිරීම සඳහා දරණ උත්සාහය පිටුපස පවත්නා සැබෑ හේතුව කවරක්ද?

2. පනත් කෙටුම්පත මගින් දරිද්‍රතාවය දුරුකිරීම හා තිරසර සංවර්ධනය මුදුන් පමුණුවා ගැනීම යන කාරණා සිදු කළ හැකි යැයි රජය තහවුරු කිරීමට උත්සාහ කළ ද එම පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා බලය මධ්‍යගත කිරීම අවශ්‍ය වන්නේ ද?

3. පළාත් සභා වෙත අවම බලතල ප්‍රමාණයක් පමණක් ප්‍රධානය කර ඇති දහතුන්වන සංශෝධනය යටපත් කිරීම සඳහා පනත් කෙටුම්පත මගින් උත්සාහ දරන්නේ කවර කරුණක් නිසාද? මෙය, පවත්නා ස්වරූපයටත් එහා ගිය දහතුන්වන සංශෝධනය පාදක කරගත් දේශපාලන විසඳුමක් ලබා දීම පිළිබඳව රජයම දරණ ස්ථාවරයට සපුරා පටගැනි වුවකි.

4. පනත් කෙටුම්පත මගිත් ඉමහත් බලතල ප්‍රමාණයක් අමාත්‍යවරයා වෙත ලබා දී තිබුණ ද එවන් බලතල ප්‍රමාණයක් අමාත්‍යවරයා වෙත පවරා දි ඇත්තේ ඇයි ද යන්න සනාථ කරනසුළු සහේතුක කරුණු දැක්වීමක් මෙකී පනත තුළ දක්නට නැත.

5. අමාත්‍යවරයාගේ බලතල ක්‍රියාවට නැගීමේදි (කැබිනට් අනුමැතිය, ගිනුම් පරීක්ෂණ ආදිය) ඊට අදාළව පැවතිය යුතු ආරක්ෂණ ක්‍රමවේදය (Safeguards) කුමක්ද? එමෙන්ම බලය අනිසි ලෙස යොදා ගැනීම (උදා: මැතිවරණ අතරතුර) සහ මහජන මුදල් අනිසි ලෙස යොදා ගැනිම වලකාලීමට තරම් එම ආරක්‍ෂණ ක්‍රමවේදය ප්‍රමාණවත් ද?

6. යෝජත දිවිනැගුම ප්‍රජා මූලික බැංකු පාලනය කිරීම හා අදාළ ආයතනික ව්‍යුහය, තැන්පත් කරුවන් ආරක්‍ෂා කිරීමට තරම් ප්‍රමාණවත් ද?

7. යෝජිත දිවිනැගුම දෙපාර්තමේන්තුව අදාළ සේවකයින් කෙරෙහි සහ සමෘද්ධි අධිකාරිය, දක්‍ෂිණ සංවර්ධන අධිකාරිය හෝ උඩරට සංවර්ධන අධිකාරියේ දැනට රැදී සිටින සේවකයන්ට අදාළ වරප්‍රසාද කෙරෙහි කවරාකාර ලෙස බලපානු ඇතිද?

8. යෝජිත රහස්‍යභාවය හා සබැඳි වගන්තියෙහි (38 වන වගන්තිය) විෂයපථය එහි අරමුණ ලෙසින් සඳහන් අරමුණ දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ රහස්‍යභාවය ආරක්‍ෂාකිරීම යන්න යුක්තිසහගත කරන්නේද?

9. මෑතකාලීනව, ගෙවුණු සති කිහිපයේදී රජය පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය යන සංකල්පය ආරක්‍ෂා කිරීම උදෙසා කටයුතු කළේය. මහජන මුදල්වලට අදාළ ව ව්‍යවස්ථාව මඟින් සම්පාදනය කර ඇති පාර්ලිමේන්තු බලය කෙරෙහි මෙය අදාළ නොවන්නේ ද? පනත් කෙටුම්පත එහි වර්තමාන ස්වරූපයෙන් බලාත්මක වන්නේනම් මහජන මුදල් කෙරෙහි පාර්ලිමේන්තුව සතු සියලු බලතල යටතේ කරනු ලබන්නේ ය.

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


ලිපිනය : 24/2, 28 වැනි පටුමග, මල් පාර, කොළඹ 07.
දුරකථන: +94 (11) 2565304/5/6
ෆැක්ස්: +94 (11) 4714460
වෙබ් අඩවිය: *www.cpalanka.org*
ඊමේල්: *info@cpalanka.org*